





ධර්මකාමී පින්වතුනි.

අද බක් මස පුර පසළොස්වක පොහොය දිනයයි භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වරට ලක්දිවට වැඩම කොට චූලෝදර මහෝදර නා රජුන්ගේ සමගිය ඇති කිරීම සිහිපත් කරන දිනයයි.

අද මෙම දහම් පණිවුඩයට මාතෘකා කරගනුයේ තථාගතයන් වහන්සේ වදළ සූත්‍ර පිටකයේ සංයුතත නිකායේ පළමු පොතෙහි අඩංගු උදය සූත්‍රයයි මේ සූත්‍රය දේශනා කරන අවස්ථාව වන විට බුදු පියාණන් වහන්සේ වැඩ සිටියේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි ය. දිනක් පෙරවරුවේ පාත්‍රයද රැගෙන උදය නැමැති බ්‍රාහ්මණයාගේ නිවසට බුදු හිමියන් වැඩම කළා. එහෙම වැඩම කළේ එම බමුණාට ධර්මය අවබෝධ කර ගැනීමට භාග්‍ය ඇති බව බුදු නුවනින් දුටු නිසයි. උදය බමුණාද බුදුහිමියන් දැක සතුටු වී ආහාරයෙන් පාත්‍රය පිරෙව්වා. ඒ දානය පිළිගෙන බුදුහිමියන් ආපසු වැඩම කළා. දෙවනි දවසෙත් උදය බමුණාගේ නිවසට වැඩම කළා. බමුණා එදිනද පාත්‍රය ආහාරයෙන් පිරෙව්වා. තුන් වන දිනයෙත් වැඩම කළා

එදිනද පෙර දින දෙකෙහි මෙන් භෝජනයෙන් පාත්‍රය පිරෙව්වා. එනමුත් එදින තරමක අප්‍රසාද හිතක් ඇති කරගත් බමුණා දන් බෙදීමෙන් පසු ..ආහාරයට ගිජුවූ ශ්‍රමණ භවත් ගෞතමයන් නැවත නැවත මේ ගෙදරටම එන්න ගත්තා නේද?.. (පකටඨ කොයං සමණො ගොතමො පුනපපුනං ආගචඡතී) යනුවෙන් නෝක්කඩුවෙන් කිව්වා. අදත් ඇතැම්මු දන් දීලා යනකම් ඉඳලා හෝ නැති තැනදී දෙස් කියනවා. ඇතැම් විට මස් මාළු සමග දන් දී එම දයකයා විසින්ම දෙස් කියනවා අර හාමුදුරුවෝ මස් මාළු සමග වැළඳුවාය කියලා. ඒ දන් දීම පිළිබඳව හරි අවබෝධයක් නැතිකමයි. උදය බමුණාද ඒවාගෙයි. දීමේ සිරිතට මිස දින තුනක්ම දන් දුන්නේ අවබෝධයෙන් නොවේ. ඒ කාරණය බුදුපියාණන් වහන්සේ දන්නවා. තමන් වහන්සේ එම වචන බලාපොරොත්තුවෙනුයි මහා කරුණාවෙන් උදය බමුණා වෙත වැඩම කළේ. එම බමුණා කියන ලද වචනයම නැවත නැවත එනවා (පුනපපුනං ආගචඡති) යොදා ගනිමින් ගාථා හතරකින් කරුණු දහසයක් උපමා වශයෙන් පැහැදිලි කරලා තෝරලා දෙනවා. එය සෝලස පුනපපුන ධම් යනුවෙන් හැඳින්වෙනවා භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වය ලැබීමෙන් අනතුරුව ප්‍රථම වශයෙන් ප්‍රීති වාක්‍යයක් ඉදිරිපත් කරනවා. නැවත නැවත සසර ඇවිදීමේ හේතුව සොයමින් නොයෙක් වර ඉපදීමට දුකඛාජාති පුනපපුනං යනුවෙන් වදරාතියනව. ඉතිං අපේ ජීවිතයේ ද නැවත නැවත සිදුකරනදේ සිදුවෙන දේ බොහෝ තියනවා. ඒ අනුව මේ දේශනාව කරනවා.

..ගොවියෝ නැවත නැවත වපුරනවා, වැස්ස නැවත නැවත වහිනවා, ගොවියෝ නැවත නැවත කුඹුරු සීසානවා, අස්වනු ඵලය (ධාන්‍ය) නැවත නැවත රටට ඇති වෙනවා.. පළමු ගාථාවෙන් මේ සිද්ධි හතර ඉදිරිපත් කරනවා මේ පිළිබඳව හිතා බැලීමේදී මේවා නැවත නැවත කළ යුතුම සහ සිදු විය යුතුයි. එහෙම නොවුනොත් මනුෂ්‍ය ජීවිත පැවැත්ම නැති වෙනවා. ඒ නිසා ලෝකයේ හැම මනුෂ්‍යයෙකුම ඉහත කී කරුණු හතර අපේක්ෂා කරනවා.

ඊළඟට භාග්‍යවතුන් වහන්සේ කරුණු හතරක් පැහැදිලි කරනවා. ..යාචකයෝ නැවත නැවත ඉල්ලති. දන් දෙන ඇත්තෝ (දානපතින්) නැවත නැවත දන් දෙති. දානපතියන් එසේ නැවත නැවත දන් දීමෙන්, නැවත නැවත ස්වර්ගයට හෙවත් සුගතිගාමී වෙනවා.. මේ කාරණා හතරත් ලෝකයේ නැවත නැවත සිදු වෙනවා. යාචකයෝ නැවත නැවත කුසගිනි ඇති වන නිසා ඉල්ලනවා. එය නැවත නැවත සිදු වෙනවා. දන් දෙන ඇත්තෝ නැවත නැවත දෙනවා කෙසේ හෝ දෙනවා. දනපතියන් නැවත නැවත සුගතිගාමී වෙනවා. සැප ලබනවා. අරමුණ කෙසේ හෝ දන් දීම නිසා නැවත නැවත මනුෂ්‍යයෝ සැප ලබනවා.

ඊළඟ ගාථාවෙන් බුදුපියාණන් වහන්සේ වදරනවා ..කිරි දෙවන්නෝ නැවත නැවත දෙනුන්ගෙන් කිරි දෙවනවා. වසු පැටියෝ නැවත නැවත මව් දෙනුන් ළඟට එනවා. සත්වයා නැවත නැවත කෙළෙස් බරිත කමින් කෙළෙස් වසඟව කලාන්ත වෙනවා. කම්පා වෙනවා.

බාලයා (අනුවනයා) නැවත නැවත ගැබට පැමිණේ හෙවත් උපදී.. කිරි දෙවන ගව පාලකයෝ උදේ සවස නැවත නැවත කිරි දෙවීම කරනවා. එය ඒකාන්තයෙන්ම කරනවා වසු පැටියාද නැවත නැවත මව් දෙන ළඟට විත් කිරි උරනවා. ලෝක සත්‍වයා නැවත නැවත කෙළෙස් නිසා නොවටහා ගෙන කෙළෙස් වසඟ වෙනවා. මෙහිදී කලාන්ත වෙනවා. (පුනපපුනං බිලමති එනදතීච) යනුවෙන් දක්වනුයේ සත්‍වයා කෙලෙස් නිසා භ්‍රාන්ත වෙනවා. භ්‍රමණය වෙනවා. ඒ ඒ පුද්ගලයා ඇති කර ගන්නා වූ ආසාවන්ගේ ප්‍රමාණයට ආස්වාද ලබනවා. කලාන්ත වෙමින් භය වෙමින් නොසන්සුන් වීම නිසා තමන් කරන්නේ මොනවද යනුවෙන් නොදනී එහි ආදීනව නොදනී. ඒ නොදන්නා කම නිසාම කම්පා වෙනවා බුදුපියාණන් වහන්සේ මෙහිදී (මන්‍දො) යනුවෙන් භාවිතා කළේ ඉතා බාල දැනුම හෙවත් සත්‍වයන්ගේ මන්ද බුද්ධික භාවයයි. දැනුමක් ඇති උගත් කෙනෙකු වුවද  නැවත නැවත ඔහු ගැබකට පැමිණීමට භවගාමී කම් රැස් කරයි නම් ඒ සත්‍වයා මන්ද බුද්ධිකයෙක් යැයි වදාරනව මෙසේ කියන විට අපිද මන්‍ද බුද්ධිකයෝ හෙයින් ලජ්ජා විය යුතුය. නැවත නැවත මෙහෙම භවගාමී වීම  අප තුළ පවතිනුයේ ඇයි ද? විමසිය යුතුය. කෙළෙස් බරිතව ක්ලාන්ත වීමෙන් මනා සිහිය පිහිටුවා නොගැනීමෙන් නැවත නැවත සෑහීමකට පත් නොවන සිතක හිමිකරුවන් වීම නිසාය. උදය බමුණාට ඔහුගේම වචනයෙන් දන්නා තැනින් නොදන්නා තැනට ගෙන යාම බුදුපියාණන් වහන්සේගේ පරමාභිලාශය විය. ලෝක සත්වයා යන වැරදි වූ දුක් සහගත වූ මග වලකා දුකින් නිදහස් වීමේ මග කියා දී මටය මන්‍ද බුද්ධිකයින් වශයෙන් භවයට නැවත නැවත වැටීම දුකක් බව පෙන්වා දීමටය.

ඊළඟට හතරවෙනි ගාථාව ඉදිරිපත් කරනවා ..නැවත නැවත සත්‍වයා උපදී,  නැවත නැවත සත්‍වයා මිය යයි, නැවත නැවත මළ කඳ සොහොනට ගෙන යනවා. දිරාපත් වෙනවා, නුවණ ඇති පුද්ගලයා නිවන ලබා නැවත නැවත උප්පත්තියක් නොලබා සසර ගමන නවතා දුකින් මිදී ගැබක නැවත නැවත ඉපදීම නතර කරයි..

 භවගාමී කරුණු රැස් කරන පුද්ගලයා ඒ හේතුවෙන්ම (හේතු ප්‍රත්‍යයෙන්ම) නැවත නැවත සසරෙහි උපදිනවා එහෙම උපදින උපදින වාරයක් පාසා මරණයට පත් වෙනවා ඒ මරණය දුකකි ඒ දුක ඇති කර ගන්නේ කවුද? තමා විසින්මයි ඒ ඉපදීම නිසයි  දුකට පත් වෙන ඒ උපතට හේතුව කුමක්ද? අවිද්‍යාව හෙවත් සත්‍ය නොදන්නාකම  නිසයි. එසේ නැත්තම් උදය බමුණාට මේ සූත්‍රයේ වදළ පරිදි මන්ද බුද්ධිය නිසයි. ඉතින් උගත් නුගත් හැමෝම බුදධ සඳණය ඉදිරියේදී මන්ද බුද්ධිකයෝ වෙන විදි උදය බමුණාට පැහැදිලි කරනවා ඒ තත්වයෙන් අපි හැමෝම මනින්න ඕන ඒ මරණය නිසාම සොහොනට (සීවථිකයට) ගෙනියනවා නැවත නැවත  එසේ ගෙනියන්නේ නැවත නැවත මරණයට පත් වන නිසයි

මෙන්න මේ තත්වය දකින යම් කිසි කෙනෙකු වී නම් ඒ පුද්ගලයා පුනර් භවයට හේතුවන කරුණු නුවණින්ම දකිනවා ආදීනව දකිනවා ඒ දුක් ඇති නොවීමට හේතු වන අංග

අටකින් යුක්ත මාර්ගය අනුගමනය කරනවා එහි අනතුරු නැති පුනර්භවය හෙවත් නැවත භවයක් නොලබන (මගගකදව ලදධා අපුනබභවාය) නිවන් මාගීයයි.

කරණීය මෙතත සුත්‍රයෙහිද (දිටඨිකදව අනුපගමම සීලවා) දෘෂඨිය හෙවත් ආත්ම වාදී අපාගින්න නැතිකොට (දසසනෙන සමපනෙනා) දශීනයෙන් සමන්විතව එනම් සම්මා දෘෂ්ඨිය හෙවත් නුවනින් දුක දැක (කාමෙසු විනෙයය ගෙධං) වස්තු කාම ක්ලේශකාම යන්ගෙන් ක්ලාන්ත නොවී කම්පා නොවී එයින් විනිර්මුක්තව (නහිජාතු ගබභසෙයයං පුනරෙ තීති) නැවත නැවත මව් කුසට නොඑතියි වදාළහ.

එසේනම් නිවන් මග වන්නේ ආයෲ අෂ්ඨාංගික මාර්ගයයි එනම් නැවත නැවත ඉපදීම නැති කරන මාර්ගයයි පුනර්භවය හෙවත් නැවත නැවත ඉපදීමට හේතු වන්නේ භව තණ්හාවයි ඒ නිසා ප්‍රථම ධම් දේශනාවේදී (යායං තණහා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍රතත්‍රාභි නන්දිනී) යනාදී වශයෙන් මහණෙනි මේ තෘෂ්ණාව නැවත නැවත ඉපදීම හෙවත් පුන පුනා භව ගාමී ගමන කර දෙනු ඇත. ඒ ඒ භවයන්හි ඒ ඒ සථාන කෙරෙහි ආලය හෙවත් පිපාසාව පෝෂය කරයිද ඒ තෘෂ්ණාවේ සවභාවයයි වදරා ඇත. ආයෲ අෂ්ඨාංගික මාගීය ඒ තෘෂ්ණාව නැති කරන නිවනට පමුණුවන ක්‍රමවේදයයි. ඒ අනුව යමෙක් කටයුතු කරයි නම් මහා ප්‍රඥාවෙන් යුක්ත පුද්ගලයා යනුවෙන් බුදුරජාණනන් වහන්සේ විසින් හඳුන්වනවා (පුනපපුනං ජායති භූරිපඤෙඤති) මහ නුවණ ඇති පුද්ගලයාය. යනුවෙන් උදය බමුණාට කියලා දෙනවා.

ඊළඟට මන්ද බුද්ධිකයා කෙසේද? යනුවෙන් පැහැදිලි කරනවා. (පුනපපුනං ගබභ මුපෙති මනෙදා) නැවත නැවත ගැබක උපත ලැබීමට භවගාමී කම් රැස් කරනුයේ මහා අනුවනයා මන්ද බුද්ධිකයා යනුවෙනි.

බුදුරජාණන් වහන්සේ උදය බමුණා දන්නා තැනින් නොදන්නා තැනට ගෙනියන ආකාරය ඉතා ආශ්චර්යයි නැවත නැවත කරන කටයුතු සහ නැවත නැවත සිදු වීම් වශයෙන් බීජ වැපිරීම, වැස්ස වැසීම, කෙත් සී සෑම, ධාන්‍ය නැවත නැවත රටට ලැබීම, යාචකයෝ යැදීම, දානපතියෝ දීම, ඔවුන් සුගතියට යෑම, කිරි දෙවීම වසු පැටියා මව් ලඟට නැවත යාම, නැවත නැවත සිදුවන සංසිද්ධි උදය බමුණාට වටහා ගැනීමට අපහසු නොවේ ඒ දන්නා තැනයි එනමුත් භව ගාමී ගමන පිළිබඳව සත්වයාට වැටහීමක් නැත ඒ නොදන්නා තැනයි උදය බමුණාටද ඒ උපමා සමග සත්වයා කෙලෙස් දාහයෙන් පරිපීඩිතව දුකට පත් වීම (ක්ලාන්තව කම්පිත වීම ) නැවත නැවත ගැබට පැමිණීම, ඒ නිසා ඉපදීම. මරණයට පත් වීම, සොහොනට ගෙන යාම ඉහත කී හේතු ප්‍රත්‍ය ධම්තාවය බවට සනාථ කොට උදය බමුණාට ධම්ාලෝකය උදා කළහ එතැන් පටන් නැවත නැවත ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් උපායාසයෝද (ඇඬීම් කම්පා වීම්) ආදියද නැවත නැවත ඇතිවන්නේ මන්ද බුද්ධික කම නිසා බව වැටහින

භව ගමන අත්හැරීම යනු නිවනයි. අත්හැරීම පුහුණුවීම සඳහා දන් දිය යුතුය ( පුනපපුනං දනපතී දදනතී) දනපතියෝ නැවත නැවත දන් දී සුගතිය හෙවත් දිව්‍ය මනුෂ සැප ලබති එය නැවත නැවත සිදුවීම දුකකි. දිනක් එක්තරා දේවතාවෙක් භාග්‍යවතුන් වහන්සේගෙන් විමසනවා කාලය ගෙවීමෙන් වයසට යෑම නිසා මරණය කරා සත්වයා පමුණුවනවා එහෙයින් ඒ ත්‍රිවිධ භයෙන් මිදීමට සැප ලැබෙන පින් කළ යුතුයි නේද යනුවෙන්, ඊට පිළිතුරු දෙන බුදුහිමියන් එම භය තුන නුවණින් දකින්නා නැවත නැවත

භවයේ උපදින පින් කිරීම නොව එසේ භවයට හේතු වන ආමිසය (භවගාමී කර්ම) දුරු කළ යුතුය යනුවෙනි. දන් දීම නරක දෙයක් යැයි මෙහිදී නොකියන නමුදු එය ධර්මානුකූලව තේරුම් ගනිමු. තණ්හාව නැති කිරීම සඳහා ප්‍රාථමික මට්ටමින් අත් හැරීම දානය බව අප දනිමු එය නැවත ඉපදීමට හේතු වේ. එනමුත් නැවත නො ඉපදීමට හෙවත් නිවන් දැකීමට උපරිමයෙන් පරමාර්ථ වශයෙන් අත් හැරීමට පරිත්‍යාග කළ යුතුයි. බුදුරජාණන් වහන්සේ චතුරාර්‍ය සත්‍ය දේශනාවේදී (..යො තසසායෙව තණ්හාය අසෙසවිරාග නිරොධො චාගො පටිනිසසගෙගා මුතති අනාලයෝ ......) යනුවෙන් පැහැදිලි කළේ ''චාගො''(ත්‍යාග) හෙවත් පරිත්‍යාගයයි. එය පරිපූර්ණ අතහැරීමයි. දන අතරින් ධර්ම දානය උතුම් වන්නේ දානය පරිත්‍යාගය ආදී සියළු දේශනාවන් දුකින් මිදීම සඳහා එහි තුළ අඩංගු බැවිනි.

පරිත්‍යාගය යනු සම්පූර්ණ වශයෙන් අත් හැරීමයි. එය ඉතා පුළුල් අර්ථයකින් ශේෂකර නොගෙන නැසීමක්, අත් හැරීමක්, මිදීමක්, ආලය නොකිරීමක් යන ආදී වශයෙන් ..චාගො.. (ත්‍යාග) යන වචනයේ ගැබ් වී ඇත. එසේ අත් හරිනුයේ ලෝකයයි. හේතුව අප මමය මාගේය යනුවෙන් අල්ලාගෙන ඉන්නේ ලෝකයට අයත් දේවල්ය. එනම් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ඵර්ශයන්ය. තවත් විදියකින් කියනව නම් ඇසට පේන, නහයට දැනෙන, කනට ඇසෙන, දිවට දැනෙන, කයේ හැපෙන දේ යනු ලෝකයයි. එනම් පංච කාම සම්පත්තියයි. එයට ඇති බැඳීම ඇලීම යමෙක් අත්හරී නම් ලෝකය අත් හැරීමයි.

උදය බමුණා දන්නා තැනින් නොදන්නා තැනට පමුණුවා යා යුතු මග කියා දුන්නා බමුණ කියනවා සවාමීනි‍ යටිකුරු කළ යමක් උඩුකුරු කළා වගේ වැසුනු දෙයක් ඇරිය වගෙයි. මං මුලා වුවෙකුට මග කිව්වා වගෙයි. ඇස් ඇති කෙනෙකුට රූප දකින්න පහනක් දැල්ලුවා වගෙයි. මට විවිධ ආකාරයෙන් න්‍යායෙන් ධර්මය කියා දුන්නා. සවාමීනි අද පටන් මම දිවි හිමියෙන් ඔබ වහන්සේගේ සරණ ගිය උපාසකයෙකු ලෙසට සළකන්න යයි කිව්වා. කෙටියෙන් කියනවා නම් ශ්‍රද්ධාවන්තයෙකු ලෙසට සළකන්න යයි මේ ගරු බ්‍රාහ්මණයා වැඳ වැටුණා බ්‍රාහ්මණයා උපාසකයෙක් බවට පත් වුණා. වර්තමානයේ උපාසකයෝ බ්‍රාහ්මණ වෙන්නයි උත්සාහය උපාසක පදවිය බුද්ධකාලයේ රාජ රාජ මහා අමාත්‍යවරු ගෞරවයෙන් නමස්කාර කරමින් ඉල්ලූ ගරුතර පදවියක් ත්‍රිවිධ රත්නයේ ගිහි භාරකාර උතුම් පදවියයි. අද දළදා වහන්සේගේ ගිහි භාරකාරත්වය දරන දියවඩන නිළමේ තුමා වාගෙයි. බුදුරජාණන්

වහන්සේගේ ගිහි භාරකාර පදවිය යනු මහෝපාසක පදවියයි. උදය බමුණුතුමාට ත්‍රිවිධ රත්නය හිමි වුණා. බ්‍රාහ්මණ කම නොවටිනා තත්වයට වැටුණා .

අපිද උදය මහෝපාසකතුමා සේ තේරුම් ගනිමු නැවත නැවත මව් ගැබට පැමිණෙන විදිහට මන්ද බුද්ධිකයෙක් නොවීමට තමන්ට තමන් දෙෂාරෝපනය කරමින් සසර ගමන කෙළවර කරමු.

